# මුස්ලිම් සංස්කෘතික අංගයන් කෙරෙහි ශ්‍රී ලංකා අග්නිදිග විශ්ව විද්‍යාලයේ සිංහල ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ ආකල්ප

S.M.M. Mazahir[1], M.J.F. Nilfa[2], M.I.F. Imna[3]

Faculty of Islamic Studies and Arabic Language, South Eastern University of Sri Lanka.
[1] mazahirsmm@seu.ac.lk, [2] fathimanilfa80@gmail.com, [3] imnaishan@gmail.com

***සාරාංශය***

*අප කවුරුත් මනුෂ්‍යයන්ය. මනුෂ්‍යයන් ට ජීවත්වීමට නීතියක්(ක්‍රමයක්) අවශ්‍යය. එම නීතියට අප ධර්මය යනුවෙන් කියන්නෙමු. ඒ නීති රාමුව; එනම් ධර්මය එක් එක් ජන කණ්ඩායම් අතර වෙනස් වන අතර එහි ශ්‍රී ලංකාව බහු ජාතික ජන සමාජයක් ජීවත් වන රටක් බව පැවසිය හැක. ඇතැම් විට එක් එක් ජාතීන් අතර ආගමික සංහිඳියාව තිබිය ද ,සමහර විට එකිනෙකාගේ සංස්කෘතීන් අනෙකාට ජීරණය කිරීමට නොහැකි වනු ඇත. එහිදී මුස්ලිම් සංස්කෘතික අංගයන් කෙරෙහි ලාංකික අන්‍යාගමිකයන්ගේ ආකල්පය හඳුනාගෙන එහි තිබෙන වැරදි වැටහීම් වලට පිළියමක් යෙදීමේ අරමුණින් අප ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලයේ ඉගෙනුම ලබන සිංහල විද්‍යාර්ථයින්ගේ ආකල්පය මෙහිදී විමසීමට ලක් කර ඇත. එහිදි දත්ත රැස් කිරීම සඳහා මාර්ගගත ක්‍රමය හරහා ප්‍රශ්නාවලියක් ඉදිරිපත් කිරීම මගින් අප දත්ත රැස්කළ ගත් අතර අප ඔවුන්ගේන් එම ප්‍රතිචාර සමාලෝචනය හා විශ්ලේෂණ කළ විට පසක් වූයේ ජාති භේදයකින් තොරව එක් මව් කුසේ ඉපදුනු දරුවන් ලෙස සහයෝගයෙන් ජීවත්වීම ශ්‍රී ලාංකික පුරවැසියන් වන අපගේ වගකීම බව ප්‍රකාශ කර තිබුණද තවත් සිසුන් පිරිසක් මුස්ලිම්වරුන්ගේ ආගමික සංස්කෘතිය පිළිබඳව මනා අවබෝධයකින් තොර වීම නිසා ඔවුන්ගේ ආකල්ප සිතුම් පැතුම් සෘණාත්මකව ද තිබුණි. තවද මෙම පර්යේෂණය සිංහල ළමයින්ව අරමුණුකොට සිදු කිරීමට හේතුව වන්නේ ශ්‍රී ලංකාවේ පවතින ජනවර්ග තුළින් සිංහල හා මුස්ලිම් ජන වර්ගයට පමණක් බොහෝ ගැටුම් නිර්මාණය වන අතර එබැවින් ඔවුන්ගේ සමාජය තුළ මේ පිලිබඳව කුමන සිතුවිල්ලක් පවතිනවා ඇත්දැයි යන්න විමර්ශනය කර බැලීම සඳහා වේ. එය ඔවුන්ගේ වැරදි චේතනාව නොව ඔවුන්ට* සමාජයේ විසින් ලැබුණු අත්දැකීම් බව අපට තේරුම් ගත හැකි විය. එම නිසා මෙයට යෝජනා ලෙස ශ්‍රී ලංකා අග්නිදිග විශ්ව විද්‍යාලයේ පරිපාලන අංශය විසින් සියලු ආගම් අදහන සිසුන් එක්රැස් කර වැඩපිළිවෙල දියත් කිරීම, සියලු සිසුන් එක්රැස්වී සාමූහිකව බාහිර ක්‍රියාකාරකම් වල නියැලීමට අවස්ථා සැලසීම යන ක්‍රියාමාර්ගයන් ගතහොත් නිවැරදිය. එම ගැටලුවට පිළියම් නසවීමහිලා ඔවුන් සතුව ප්‍රයෝගික තලයේ අදහස් බොහෝමයක් දැක ගත හැකිය. එම සමහර යෝජනා, පර්යේෂණයට පමණක් සීමා නොකර ඒවා ක්‍රියාත්මක කිරීම තුළින් සියළුම ජාතින් සහජීවනයෙන් ජීවත් වීමට ඉවහල් වේ.

***කේන්ද්‍රීය වචන:*** ශ්‍රී ලංකා අග්නිදිග විශ්ව විද්‍යාලය, ආගම, ඉස්ලාම්, ආකල්ප, සිසුන්, සිංහල

**හැදින්වීම**

ආගම වූ කලී දේවධාර්මික අර්ථ නිරූපණය, ආගමික භාවිතය හා පරිපාලනය මත පදනම්ව, එකඟ නොවීම හා විවිධත්වය අනුව හැඩ ගැසුණු සමාජය ගොඩනැංවීමකි. ලෝකයේ බහුතර රටවල් ගත් කළ ඒ රටටම කියා අනන්‍ය වූ ජාතියක් ආගමක් තිබුණද ශ්‍රී ලංකාව ඊට හාත්පසින්ම වෙනස් වූ බහුවාර්ගික ජන සමාජයක් ජීවත් වන රටකි. ශ්‍රී ලංකාව තුළ සිංහල, දෙමළ, මුස්ලිම් හා ක්‍රිස්තියානි යන ජාතීන් ජීවත් වන බහුජාතික සමාජයකි.

මෙම ජාතීන් අනෙක් ජාතීන් මත පදනම් වූ වැටහීම් අතරින් ධනාත්මක ආකල්ප මෙන්ම ඍණාත්මක ආකල්ප ද ඇති කර ගනිමින් වැරදි වැටහීම් නිසා අද ලංකාව තුළ බොහෝ ජාතික ගැටුම්, අරගල ඇති වීමට ප්‍රධාන හේතු වී තිබේ.මෙම ගැටළුව පාදක කොට ගනිමින් නැගෙනහිර පළාතේ පිහිටි එක් රාජ්‍ය විශ්වවිද්‍යාලයක් වූ ශ්‍රී ලංකා අග්නිදිග විශ්ව විද්‍යාලයේ ඉස්ලාමීය අධ්‍යයනය හා අරාබි භාෂා පීඨයේ අප විසින් මුස්ලිම්වරුන්ගේ සංස්කෘතික අංගයන් කෙරෙහි අප විශ්වවිද්‍යාලයේ ඉගෙනුම ලබන සිංහල සිසුන්ගේ ආකල්පය පිළිබඳ විමසා දැන ගැනීම උදෙසා මෙම පර්යේෂණය සිදු කළෙමු.

මෑත කාලයේ දී ශ්‍රී ලංකාවේ සමහර ජනවාර්ගික ගැටුම් නිසා මරණයට පවා මග පාදා තිබේ.මෙයට හේතුව ඒ ඒ ජාතීන්ගේ සංස්කෘතික අංගයන් ද එනම් ඔවුන්ටම කියා ඒකීය වූ සංස්කෘතියක් පිළිබඳව අනෙක් ජාතීන් මනා අවබෝධයකින් තොරව තමාට සිතූ පරිදි අදහස් මහජනයා අතර ප්‍රචාරය කිරීම ජනවාර්ගික ගැටලුවට තුඩු දුන් ප්‍රධාන හේතුවක් බවට පත් වී ඇත. අද සමාජයේ මුස්ලිම්වරුන්ගෙන් ඔවුන්ටම කියා අනන්‍ය වූ සංස්කෘතීන් වශයෙන් අපට ඇසට ගැටෙන ජුබ්බාව, අබායා, ෆර්දාව හා මුස්ලිම් දේවස්ථාන වැනි තවත් බොහෝ දේ අනෙක් සමාජය තුළ මායාවක් බවට පත් කරමින් මුස්ලිම් ජාතීන් පිළිබඳ වැරදි ආකල්ප ඇති කිරීම සඳහා සමහර පිරිස් කටයුතු කරමින් සිටිති.

කෙසේ නමුත් ආගමික අමනාපකම් සහ ප්‍රකෝපකාරී තත්වයන් නිරාකරණය කිරීමට නම් පුද්ගලයන්ගේ ආකල්ප වෙනස් කළ යුතුය. එසේ පුද්ගල ආකල්ප වෙනස් වූයේ නම් සමාජයේ ඇති වූ ජනවාර්ගික ගැටුම් නිරායාසයෙන්ම වෙනස් වන බව නොඅනුමානය.

## 1. අරමුණු

ශ්‍රී ලංකා වැනි සංස්කෘතික ජන සමාජයක් තුළ සිංහල,දෙමළ,මුස්ලිම් හා ක්‍රිස්තියානි යන ජාතින් ජිවත් වේ. එහිදී මුස්ලිම් ජාතින්ට තරමක් වෙනස් වූ සංස්කෘතීන් ඇති හෙයින් ශ්රී ලංකාව තුළ වෙසෙන අන්‍ය ජාතිකයන්ට මුස්ලිම්වරුන්ගේ සංස්කෘතික අංගයන් පිළිබඳව පැහැදීමක් නොමැති හෝ ඒ පිළිබඳව වැරදි ආකල්පයකින් තේරුම් ගෙන සිටිති. එම නිසා අන්‍ය සමාජෙයන් මුස්ලිම් සංස්කෘතික අංගයන් පිළිබඳව ආකල්පයන දැන ගැනීමට අවශ්‍ය වූ නිසා ශ්‍රී ලංකා අග්නිදිග විශ්ව විද්‍යාලයේ සිංහල ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ ආකල්පය හඳුනා ගනිමින් එහි හඳුනාගත් වැරදි වැටහීම් වලට පිළියමක් යෙදීමේ අරමුණින් මෙම පර්යේෂණය සිදු කරන ලදී.


ISBN 978-624-5736-14-0

## 2. පර්යේෂණ ක්‍රමවේදය

මෙම පර්යේෂණය විස්තරාත්මක විශ්ලේෂණ ක්‍රමෝපායන් (Descriptive) අනුගමනය කරමින් සිදු කරන ලද පර්යේෂණයක් වන අතර එහිදී ප්‍රාථමික දත්ත රැස් කිරීම ශ්‍රී ලංකාවේ අග්නිදිග විශ්වවිද්‍යාලයේ අධ්‍යාපනය හදාරන සිංහල විද්‍යාර්ථීන්ගේ තොරතුරු මත පදනම්ව සිදු කළ අතර එහි සිසුන් හැත්තෑ එක් දෙනෙකුගේ (71) දත්ත මගින් මෙම පර්යේෂණය සිදු කරන ලදී. එකී සිසුන්ගේ දත්ත ලබා ගැනීම මාර්ගගත ප්‍රශ්නාවලියක් ඉදිරිපත් කිරීම මගින් සිදු කළ අතර එය සිංහල භාෂාවෙන් ඔවුන්ට යොමු කරන ලදී. මෙසේ මාර්ගගත ප්‍රශ්ණාවලිය මගින් දත්ත රැස් කළ ද අපට වැඩි සිසුන් සංඛ්‍යාවකගෙන් ප්‍රතිචාර නොලැබුණු අතර ප්‍රතිචාර ප්‍රමාණය වැඩි කර ගැනීමට බොහෝ ක්‍රම ක්‍රමෝපායන් භාවිතා කළද අපට ලබාගත හැකිවූයේ සුළු ප්‍රතිචාර ප්‍රමාණයකි.පර්යේෂණයේ ඊළඟ පියවර ලෙස දත්ත විස්තර කිරීම, පරීක්ෂා කිරීම සහ විශ්ලේෂණය කිරීම සිදුකරන ලදී. තවද මෙම පර්යේෂණය සිංහල ළමයින්ව අරමුණුකොට සිදු කිරීමට හේතුව වන්නේ ශ්‍රී ලංකාවේ පවතින ජනවර්ග තුළින් සිංහල හා මුස්ලිම් ජන වර්ගයට පමණක් බොහෝ ගැටුම් නිර්මාණය වන අතර එබැවින් ඔවුන්ගේ සමාජය තුළ මේ පිළිබඳව කුමන සිතුවිල්ලක් පවතිනවා ඇත්දැයි යන්න විමර්ශනය කර බැලීම සඳහා වේ . තවද මෙමගින් ඔවුන් තුළ ඇතිවන ගැටුම් වලට සාධාරණ විසඳුම් සහ යෝජනා ඉදිරිපත් කරගැනීමට හැකිවනු ඇති අතර එමගින් සිංහල හා මුස්ලිම් සමාජය තුල සාමය හා සහජීවනය වර්ධනය වෙයි.එයින් ලබාගත් දත්ත විශ්ලේෂණය කොට ඒවායේ අදාළ න්‍යායන් සහ මූලධර්මවලට අනුකූලව ගැටලුවට තුඩු දුන් විෂය සාකච්ඡාවට බඳුන් කරන ලදී.

## 3. සාහිත්‍යය විමර්ශනය

ආගම සහ වාර්ගිකත්වය, ශ්‍රී ලාංකේය " ස්වීයත්වය" පිළිබඳව ජනප්‍රිය හා දේශපාලනික පරිකල්පනයෙන් වෙන් කළ නොහැකි අතර, ජාතිකත්වය, ස්වයං නිර්ණය, ස්වාධිපත්‍යය සහ බල පුළුවන්කම පිළිබඳව රටෙහි කතිකාවන් තුළ හාත්පසින් පැතිර පවතී. මේ අනුව දමිළ ,මුස්ලිම් මෙන්ම හින්දු, ක්‍රිස්තියානි සහ ඉස්ලාමය අනුගමනය කරන උඩරට දමිළ යන සෙසු ජන වාර්ගික - සුළුතරයන් තුනකින් සමන්විත රටක් තුළ එම ආගම සහ වාර්ගිකත්වය යනු රට තුළ ආගම්වාදී සාමය සහ ගැටුම් සඳහා පදනම බවට පත් වීම පුදුමයක් නොවේ.

බහුවාර්ගික සමාජයක් ජීවත්වෙන ශ්‍රී ලංකාව තුළ සිංහල ජාතීන් බහුතර සමාජයක් ලෙස ජීවත් වන අතර දමිළ, මුස්ලිම්, ක්‍රිස්තියානි යන අනෙක් ජාතීන් සුළුතර ජන කොට්ඨාශයක් ලෙස ජීවත් වෙති. ඈත අතීතයේ සියලුම ජාතීන් සාමූහිකව දිවි ගෙවුවද වර්තමානය වනවිට ජාතීන් අතර විරසක බෙදීම් ඇතිවී ඒවා අරගල ,ජීවිත බිලි ගන්නා පමණින් දුරදිග ගොස් හමාරය. ශ්‍රී ලංකාවේ මුස්ලිම් අනන්‍යතාවය වූ කලී බහු මුහුණත් සහිත වන අතර කාලය සමග සමාජය, දේශපාලනික හා ඓතිහාසික සන්දර්භය හා අන්තර් ක්‍රියා කරමින් යළි ගොඩ නැංවී තිබේ. ශ්‍රී ලංකාවේ මුස්ලිම්වරුන් ජනවාර්ගික ආගමික ප්‍රජාවක් වන අතර ඔවුන් සිය ජන වාර්ගික අනන්‍ය වූ සංස්කෘතික අංග වලින් තම ජීවිත රාමුව සකස් කර ගනිමින් දිවි ගත

කරනු ලබති. ශ්‍රී ලංකා මුස්ලිම්වරුන් සිය අනන්‍යතාවය අර්ථ නිරූපණය කොට ඇත අතීතයේ සිට ම සමාජ ආර්ථික සහ දේශපාලනික ස්වභාවයට ආරෝපණය කර තිබේ.

"වත්මන් සමාජය අතීතය දෙස බැලීමෙන් ඉතිහාසයෙන් ලද හැකි ආදර්ශයන් බොහෝය. අතීතයේ අප රට තුළ තිබුණු ආගමික සහජීවනය ඉගෙන ගත හැකි පාඩම් බොහොමයක් ඇත. විශේෂයෙන් උඩරට පාලන කාලය තුළ සහ ඊට පසුව මුස්ලිම්වරුන් සහ උඩරට සමාජය අතර තිබුණු සම්බන්ධයන් ඉතා විශිෂ්ටය". (ලෝනා දේවරාජ්, 2015) ඉහත උපුටා දැක්වූ කරුණු අනුව ශ්‍රී ලංකාව සමඟ අරාබි වෙළඳුන් අවුරුදු 2400 කට වැඩි ඉතිහාසය කින් යුක්ත වන අතර මෙරට ඉස්ලාමයේ ප්‍රවිෂ්ට වී ඇති බව උගත් බුද්ධිමතුන්ට පැහැදිලි වන කරුණකි.

ශ්‍රී ලංකාවට ඉස්ලාමය ප්‍රවිෂ්ට වූයේ ජාත්‍යන්තර වෙළඳාම හේතුවෙන් බව ආගම් පිළිබඳව හදාරන බුද්ධිමතුන් කවුරුත් පිළිගන්නා සත්‍යයකි. අරාබි වෙළඳුන් ගේ අවංක කම මෙන්ම ඔවුන්ගේ අනෙකුත් හැකියාවන් (යුද උපක්‍රම, වෛද්‍ය විද්‍යාව වැනි දේ) ගැන පැහැදුණු සිංහල රජවරුන් ඔවුන්ට සිංහල කුල කාන්තාවන් සරණ පාවා ගැනීමට අවසර ලබාදී මේ රටේ පදිංචි කරවා ගැනීමට ක්‍රියා කළ බව ඉතිහාසය අපට පැහැදිලි කරයි. (ලෝනා දේවරාජ්, 2015)

අප කවුරුත් දන්නා පරිදි ශ්‍රී ලංකාවේ මුස්ලිම්වරුන්ගේ ආරම්භය පිළිබඳව මූලික ප්‍රභවයන් රැසක් දායක වී ඇත. ඒවා නම් ලංකාවට පැමිණි අරාබි වෙළඳුන් මල භාර වෙළඳුන් සහ ජාවකයන් මගින් වේ .මේ අරාබි වෙළඳුන් සමග ශ්‍රී ලංකාවෙහි තිබුණු සබඳතාවය පූර්ණ ඉස්ලාම් යුගය දක්වා ඇතට විහිදී ඇත. "ශ්‍රී ලංකාවේ රජ කළ පණ්ඩුකාභය රජතුමාගේ කාලයේ ඉතිහාසය ගවේෂණය කරන අපට ඒ ගැන සාධකයක් හමු වෙයි. එනම් පණ්ඩුකාභය රජු (ක්‍රි:පූ:377-307) තම අගනුවර වූ අනුරාධපුරයෙහි යම් යම් ඉඩම් අගනුවරට පැමිණි පූර්ව ඉස්ලාමීය යුගයේ අරාබි වෙළඳුන් වූයෝ නකින් සඳහා වෙන් කළ බවයි.තවද අනුරාධපුර යුගයේ අගනුවර තුළ යොවුන් වාසය කළ බව ඉතිහාසයේ සඳහන් වේ. (මහාවංශය 10:90)"

ශ්‍රී ලංකාවේ ඉස්ලාම් දහමේ ව්‍යාප්තිය අරාබි වෙළඳාමේ ප්‍රතිඵලයක් වන අතර, දීර්ඝ කාලීනව රැඳී සිටීම හේතුවෙන් මුස්ලිම් වෙළෙන්දෝ දේශීය පවුල්වලින් විවාහ සිදු කරගෙන මෙම රටෙහි පදිංචි වීම නිසා ඇති වූවකි. (Shukri 1986). එහෙයින් ශ්‍රී ලංකාවේ මුස්ලිම්වරුන් මේ රටෙහි පිටස්තරින් නොවන්නේ, ඔවුන්ට අනෙකුත් ප්‍රජාවන් සමග ලේ ඥාති සබඳතා පවතින නිසාය. 9 සහ 10වන සියවස් වල ඔවුන් වෙනස් කොට දැක්වූ සහ ඔවුන්ගේ අනන්‍යතාවය හැඩගැසූ ලක්ෂණ වූයේ අරාබි භාෂාව හා ඉස්ලාම් දහමයි. 13වන සතවර්ශය තුල මුස්ලීම්වරුන් වෙළඳාම විෂයෙහි වූ වඩාත් බලපෑම් සහගත වෙමින් දිවයිනේ විවිධ වරායන් හරහා සිය වෙළඳාම පවත්වාගෙන ගිය අතර, එමගින් ඔවුන්ගේ වෙරළබඩ පදිංචිවීම් හැඩගැසුනි. පසු කාලීනව, සිංහල රජවරුන්ගේ විදේශීය වෙළෙඳ උපදේශකයින් ලෙස මුස්ලිම්වරු ඉතා බලපෑම්සහගත භූමිකාවන් රඟ දැක්වූහ.ඉන්දියාව සමග වූ මෙම මුහුදු ගමන් ක්‍රියාකාරකම් දකුණු ඉන්දීය මුස්ලිම්වරුන්ගේ වෙළඳාම ඉහළ නැංවූ වුවා පමණක් නොව, ශ්‍රී ලංකාවේ පදිංචි වීම සඳහා ද මඟ පෑදීය.ඊට හේතු වූයේ ලෝකය සමග ව්‍යාපාරික මැදිහත්වීම් සඳහා ශ්‍රී ලංකාව


ISBN 978-624-5736-14-0

සතු වූ උපායමාර්ගික ස්ථාන කෙරෙහි දකුණු ඉන්දීය මුස්ලිම්වරුන් කැමැත්ත දැක්වීමයි. දකුණු ඉන්දීය වෙළෙඳුන්ගේ මෙම පදිංචි වීම සහ ඒ සමග සිදු වූ ඉන්දියාව සමග වූ වෙළඳාම ව්‍යාප්තිය ද, දකුණු ඉන්දීය මුස්ලිම් වරුන් හා වෙළඳාම් කිරීම මත ශ්‍රී ලාංකික මුස්ලිම්වරුන්ගේ සංස්කෘතිය හා අනන්‍යතාවය කෙරෙහි බලපෑවේය.මෙකී අන්තර් ක්‍රියාකාරිත්වය ශ්‍රී ලංකාවේ මුස්ලිම්වරුන්ගේ අනන්‍යතාවයක් අතර අරාබිවරුන්ගේ සිට ඉන්දු අරාබිය දක්වා පරිවර්තනය කරමින් ඊට නව දිශානතියක් එක් කළේය.

එපමණක් නොව අධ්‍යාපන හා ජන මාධ්‍ය වේදී කටයුතුවලද මුස්ලිම් නායකයින් සිය සමාජය සඳහා විශාල මෙහෙවරක් ඉටු කරන ලදී. එහි ප්‍රධාන කතිකාව ගත් සිද්දිලෙබ්බේ මහතා පෙන්වා දිය හැකිය.

අතීතයේ සිංහල මුස්ලිම් සමගිය යහපත් අයුරින් පවත්වා ගෙන ආවත් මෑතකාලීනව ජාතීන් අතර ඇතිවූ වැරදි වැටහීම් නිසා මුස්ලිම් ජාතිකයින්ගේ සංස්කෘතිය අගය කළ ඒ පිරිස ම මුස්ලිම් ජාතිකයන්ගේ සංස්කෘතිය වෙනත් පැතිකඩකින් බැලීමට ආරම්භ කළෝය. ලංකාවේ ජීවත් වූ සියලුම ජාතීන් එක් ජාතීන් එක් මවකගේ දරුවන් ලෙස ජීවත් වූ ඔවුන් ුළු සුළු වැරදි වැටහීම් නිසා 'ජාතිය තමාට පමණයි' යන ආත්මාර්ථකාමී ගතිගුණ නිසා අද වනවිට බහුවාර්ගික ජන සමාජයක් වූ ශ්‍රී ලංකාව ජනවාර්ගික වශයෙන් තනි තනියෙන් වෙන්වී හමාරයි. නමුත් ඓතිහාසිකව මහා තලයේ දී විවිධ කාලවල දී මුස්ලිම්වරුන් සිය දේශපාලන ජනවාර්ගික සංස්කෘතික හා භාෂාමය අනන්‍යතාව යනු වෙන් කර රාමු කර ගෙන ඇති අතර ආගමික අනන්‍යතාවය පිළිබඳව ඔවුන්ගේ අවධාරණය ප්‍රධාන වශයෙන්ම ඒකාකාරී විය.

මුස්ලිම්වරුන්ගේ අනන්‍යතාවය, ඔවුන්ගේ සංස්කෘතිය, ඔවුන්ගේ භාෂා විලාසය හා මුස්ලිම්වරුන් හා අන්‍ය ආගමිකයන් අතර පවතින ගැටලු පිළිබඳව මීට පෙර බොහෝ ලිපි, පර්යේෂණ හා ග්‍රන්ථයන් ප්‍රකාශයට පත් වී ඇත. ඒවාට උදාහරණ වශයෙන් මොහොමඩ් ෆස්ලාන් සහ නදීන් වන්නියසිංහම් යන දෙදෙනා විසින් ‘‘බිඳී යන ප්‍රජාව’’ යන පර්යේෂණ ලිපියක් ද, අහ්මද් සර්ජුන් රාසික් විසින් ‘‘Socio cultural issues and the relationship between Buddhist and Muslim in Sri Lanka’’, නදීන් වන්නියසිංහම්, කසුන් පතිරාජ, මොහොමඩ් ෆස්ලාන් සහ දිනුෂ්ක ජයවික්‍රම පියාණන් කතෘවරුන් විසින් ‘‘ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක හතරක් ඇතුළු අන්තර් ආගමික ගැටුම්’’ ග්‍රන්ථයක් ද මහාචාර්ය ලෝනා දේවරාජ් මැතිණියගේ’’ ශ්‍රී ලංකාවේ මුස්ලිම්වරු සහශ්‍රකය ජනවාර්ගික සහජීවනය’’ද’මුහම්මද් මුනව්වරුල් අෆ්ලල් විසින් ‘‘බෞද්ධ,ඉස්ලාම් සුහදත්වය සහ මුස්ලිම් සමාජය’’ යන ග්‍රන්ථයක්ද ප්‍රකාශයට පත් කරන ලදී.මෙසේ පර්යේෂණයන් ප්‍රකාශයට පත් වුවද අප විසින් කරන්නා වූ මෙම පර්යේෂණයට හාත්පසින්ම වෙනස් වූ ගවේෂණය කිරීමකි. මේ පර්යේෂණය තුළ මුස්ලිම් වරුන් පිළිබඳව සිංහල ශිෂ්‍ය ශිෂ්‍යාවන් තුළ තිබෙන ආකල්පයන් හඳුනා ගනිමින් එහි ඇති වැරදි ආකල්පයන්ට පිළියම් යෙදීමේ අරමුණින් මෙය සිදු කරන ලදි.


මෙකී කරුණුවලින් පැහැදිලි වන්නේ බහු වාර්ගික ජන සමාජයක් වුවද ඒ ඒ ජාතීන්ට ම අනන්‍යය වූ සංස්කෘතික හා සදාචාරයන් තිබුණද ඒ ඔවුන්ගේ ආගමික නිදහස බව සියලු දෙනාම වටහාගෙන එක් දූ දරුවන් ලෙස ජීවත් විය යුතු බව ලංකාවාසි සියලු දෙනාගේම සිතෙහි ආකල්පයක් ගොඩනඟා ගත්තේ

නම් ලංකාව ට වඩා උසස් වූ බහු වාර්ගික ජන සමාජයක් ලෝකේ කිසිදු කුමන්ත්‍රණකරුවන් හට වත් ලංකාව පරාජය කළ නොහැකිය.

## 4. ප්‍රතිඵල හා සාකච්ඡා

ඕනෑම විද්‍යාත්මක පර්යේෂණයක් සිදු කිරීමේ දී දත්ත විශ්ලේෂණය සහ විමර්ශනය කිරීම ප්‍රධාන තැනක් ගන්නා බව සලකනු ලැබේ. අපගේ මෙම අධ්‍යනයෙන් මූලික අරමුණ වූයේ මුස්ලිම් වරුන්ගේ සංස්කෘතික අංගයන් කෙරෙහි ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලයේ අන්‍යාගමික ශිෂ්‍ය ශිෂ්‍යයාවන්ගේ අදහස අධ්‍යයනය කිරීමටය .ඒ අනුව මේ සඳහා සිසුන්ගේ අදහස ලබා ගැනීමට භාවිතා කල ප්‍රශ්ණාවලිය මගින් ඔවුන් ලබා දුන් තොරතුරු මත නිගමන වලට එළඹීම සහ සුදුසු යෝජනා සම්පාදනය කරවීම හෝ ක්‍රියාත්මක කරවීම මෙහිදී සිදු වේ.


### 5.1 ස්ත්‍රී, පුරුෂ භාවය




(Source: Research 2021)

### 5.2 ඉගෙනුම ලබන පීඨය

මෙම පර්යේෂණය සඳහා ශ්‍රී ලංකා අග්නිදිග විශ්ව විද්‍යාල පද්ධතිය තුල වාණිජ කළමනාකරණ පීඨය, තාක්ෂණ පීඨය, ඉංජිනේරු පීඨය හා ව්‍යවහාරික විද්‍යා පීඨයේ ඉගෙනුම ලබන සිංහල ශිෂ්‍යාවන් 71 පමණ කේන්ද්‍ර කොට ගනිමින් සිදුකරනු ලැබූ අතර එයින් ඔවුන්ගේ අදහස් ද පළ කරන ලදී.




(Source: Research 2021)

### 5.3 මුස්ලිම් කාන්තාවන් පළඳින අබායා සහ හිජාබය (හිස් වැස්ම)

මුස්ලිම් කාන්තාවක් තම මුහුණ හා මැණික් කටුව දක්වා අත් හැරෙන්න අනෙකුත් සියලු ශරීර අවයව නොපෙනන පරිදි ලිහිල් ඇඳුමක් ඇඳිය යුතු බව ඉස්ලාම් දහම පවසනවා. මෙම ඇඳුම "අබායා" යැයි පොදුවේ හැඳින්වෙනවා. එහි අදහස යමක් පෙනීමෙන් සැඟවීම හෝ වසං කිරීමයි. නමුත් පවත්නා වූ වකවානුවේ අබායා හී සන්දර්භය වනුයේ එය මුස්ලිම් කාන්තාවකගේ විනීත වහන්තරාව යන්නයි. අබායා යනු හුදෙක් ශරීරය සම්පූර්ණයෙන් ආවරණය කරන වස්ත්‍ර යන්නයි. හිජාබය යනු හුදෙක් හිස සම්පූර්ණයෙන් ආවරණය කරන වස්ත්‍රයක් පමණක් ම නොව නමුදු එය ඊටත් වඩා වැදගත් වන චර්යාව, හැසිරීම, කථාබහ සහ පොදු ස්ථානයන් හී පෙනී සිටින ලීලාව යන්නද තේරුම් ගන්න පුළුවන්. වස්ත්‍රය එහි එක් මුහුණුවරක් පමණයි.

| ලබා දුන් පිළිතුර | සිසුන් සංඛ්‍යාව | ප්‍රතිශතය |
|---|---|---|
| ඔවුන්ට එයින් ආරක්ෂාවක් ලැබෙන බවයි. | 16 | 22.5% |
| ඔවුන්ගේ කාන්තා නිදහස කඩවන බවයි. | 41 | 57.7% |
| ඔවුන්ව වහල් භාවයකට වැනි සීමාකරණයකට ලක් කර ඇති බවයි. | 15 | 21.1% |
| කාන්තා අයිතිවාසිකම් උල්ලංඝනය කරන බවයි. | 10 | 14.1% |
| අරාබි සංස්කෘතිය ශ්‍රී ලංකාව තුළ පැතිර යැවීමේ උත්සහයක් ලෙස. | 15 | 21.1% |

(Source: Research 2021)

එබැවින්, මෙම කාරණාව පිළිබඳ අප ඔවුන්ගේ අදහස් යොමු කළ විට බහුතරයක් විසින් එය මුස්ලිම් කාන්තාවගේ නිදහස කඩවන බව 57.7% ක ප්‍රතිශතයකින් කින් පවසා තිබුණි. තවදුරටත් ඔවුන්ව වහල්භාවයට පත් කර තිබෙන බවත් එයින් ඔවුන්ගේ කාන්තා අයිතිවාසිකම් උල්ලංඝනය කරන බවත් සුළු ප්‍රතිශතයකින් පෙන්වා දී ඇත. තවද මෙවැනි පැළඳීමකින් අරාබි සංස්කෘතිය ශ්‍රී ලංකාව තුළ පැතිර යැවීමේ උත්සාහයකින් පවතින බවක් ද ඔවුන් වැඩි දුර අදහසක් බවට දක්වා තිබුණි.එමගින්, මුස්ලිම් නොවන සමාජයේ ඉස්ලාමය ගැන තිබෙන වැරදිමත වලින් එකක් වන්නේ ඉස්ලාමය කාන්තාවන්ට නිර්ණය කරන මෙම ඇඳුමයි. එනම් ඉස්ලාමය පවසන ලෙස ඇඳීම කාන්තාවන්ට දෙන පීඩනයක් ලෙසත්, කාන්තා අයිතිය උල්ලංඝනය කිරීමක් ලෙසත්, කාන්තාවන්ගේ පුද්ගලික නිදහසට බාධා කිරීමක් ලෙසත් ඇතැමුන් සිතනවා. කෙසේනමුත් ඉස්ලාමීය ඉගැන්වීම් පිළිබඳව විවෘත මනසින් තරමක් ගැඹුරින් අධ්‍යයනය කරනවා නම් එය මිනිසාට හා සමාජයට ගෙන දෙන යහපත පහසුවෙන්ම තේරුම් ගැනීමට හැක.

කෙසේනමුත් ඉස්ලාමීය නීතියේ අරමුණ හුදෙක්ම කාන්තාවකට එක් වස්ත්‍රයක් නිර්ණය කිරීම නොව සාරධර්ම වලින් පිරුණු සමාජයක් බිහි කිරීමයි. කාන්තා වස්ත්‍රය මූලික වශයෙන් ක්‍රියා කරන්නේ මෙම අරමුණ ඉටු කරගැනීම සඳහා වූ එක් සාධකයක් ලෙසයි. කෙසේනමුත් ඉස්ලාමය පවසන කාන්තා ඇඳුම දෙස බැලීමේදී එය කාන්තාවන්ට ඉතා සුදුසු ඇඳුමක් බවත්, මෙම ඇඳුම දුෂ්ට සිතුවිලි තිබෙන පිරිමින්ගෙන් කාන්තාවන් ආරක්ෂා කර ගැනීමටත්, පිරිමින්ගේ චිත්ත පාලනයට උපකාර වනවා.

කෙටියෙන් පවසනවා නම් මෙම ඇඳුම සදාචාරාත්මක සමාජයක් බිහි කිරීමට එක් සාධකයක් ලෙස ක්‍රියා කරන බව විවෘත මනසින් මෙම විෂය අධ්‍යයනය කරන කෙනෙකුට තේරුම් ගන්න පුළුවන්. නූතන බටහිර රටවල් වල අද තිබෙන ඇඳුම් සම්ප්‍රදාය මගින් සමාජ සදාචාරයට ඇති කර ඇති හානිය දෙස බැලීමේදී කිසිවෙකුටත් ඉස්ලාමය පවසන කාන්තා ඇඳුමට කිසිසේත් චෝදනා කළ නොහැකියි.

## 5.4 මුස්ලිම් පිරිමින් විසින් පළඳින ජුබ්බා ඇඳුම හා ඔවුන්ගේ රැවුල

මුස්ලිම් පිරිමියෙකුගේ ඇඳුම කෙසේ තිබිය යුතුද යන්නත් ඉස්ලාම් දහම පවසයි. පිරිමින් ශරීරයේ නාභියේ සිට දනහිස් දක්වා ඇති කොටස ආවරණය කළ යුතුයි. ඔවුන් එම කොටස නිරාවරණය කළ හැක්කේ තම බිරින්දෑවරුන් ඉදිරියේ පමණයි. මේ හැරෙන්නට අනෙකුත් සියළු දෙනා ඉදිරියෙහි මෙම කොටස අනිවාර්යයෙන්ම ආවරණය කළ යුතුයි. ඔවුන්ගේ වස්ත්‍රයන් කාන්තාවන්ගේ වස්ත්‍රයන් මෙන්ද තිබිය නොයුතුයි. ඒ වගේම ඔවුන්ගේ ඇඳුම් කාන්තාවන්ගේ හැඟීම් අවදි කරවන තද වස්ත්‍රයන්ද නොවිය යුතුයි. පුරුෂයන්ට සේද රෙදි සහ රත්රන් පැළඳීමද තහනම්.

| ලබා දුන් පිළිතුර | සිසුන් සංඛ්‍යාව | ප්‍රතිශතය |
|---|---|---|
| බහුතර සමාජයෙන් කැපී පෙනෙන්නට ඇති අවශ්‍යතාවය නිසා | 6 | 8.5% |
| ඔවුන් ඔවුන්ගේ ඉස්ලාමීය සම්ප්‍රදාය අනුගමනය කරන බව | 8 | 77.5% |
| එය ඔවුන්ට ආවේණිකවූ විලාසිතාවක් ලෙස | 8 | 11.3% |
| අරාබි සංස්කෘතිය ශ්‍රී ලංකාව තුළ පැතිර යැවීමේ උත්සාහයක් | 14 | 19.7% |
| බියට පත්වන සුළු පැළඳුම් වර්ගයකි. | 8 | 11.3% |

(Source: Research 2021)

එබැවින්, මේ පිළිබඳව ඔවුන්ගෙන් විමසූ කල ඉස්ලාමීය සම්ප්‍රදායට ඔවුන් අනුගමනය කරන බව බහුතරයක්ගේ මතය විය. සමහරුන් විසින් එය ඔවුන්ට ආවේණික වූ විලාසිතාවක් ලෙසද තවදුරටත් බිය දනවන ඇඳුම් විලාසිතාවක් ලෙසද අර්ථ දක්වා තිබුණි. නමුදු මොවුන් බියට පත් වූ කරුණක් වනුයේ අරාබි සංස්කෘතිය මෙරට ට පැතිර වීමේ උත්සාහයක්දෝ මන්දා වන නිසාවෙනි .එම නිසා මුස්ලිම්වරුන් පලඳින ජුබ්බාව සහ ඔවුන්ගේ රැවුල අන් සමාජය තුළ වැරදි අදහසකට යොමු වී ඇත්තේ ඔවුන් ඒ ආකාරයෙන් ඉස්ලාම් ධර්මය අවබෝධය කරගෙන ඇති බැවිනි .මෙය මුස්ලිම් පිරිමින් ඔවුන්ගේ ආගමානුකූල රීතියකට අනුව පිළිපදිනව මිසක් බියට පත්වන සුළු හෝ අරාබි සංස්කෘතිය මෙරට තුළ පැතිර වීම යන කිසිදු උත්සාහයක් ඔවුන්ගේ සිත් තුළ කිසිදාකවත් මුල් පිරි නොමැත.

## 5.5 මුස්ලිම් දේවස්ථාන (පල්ලිය)

මුස්ලිම්හු දෙවියන් උදෙසා යාච්ඤා කිරීමට යොදා ගන්නා ස්ථානය මුස්ලිම් දේවස්ථානය ලෙස හැඳින්වේ එය අරාබියානු මස්ජිඩ් යන නමින්ද ව්‍යවහාර වේ. මොස්ක් (Mosque) යන ඉංග්‍රීසි වචනය

ඉස්ලාම්හු දෙවියන් නැමදීමට යොදා ගන්නා සියලු ආකාරයේ ගොඩනැගිලි හැඳින්වීමට යොදා ගත්තද, අරාබියානු භෂාවේදී කුඩා සහ පෞද්ගලික හිමිකාරිත්වය ඇති දේවස්ථාන හා විශාල ඒවා වෙනස්කර හඳුන්වා දී ඇත. ඉස්ලාම් දේවස්ථාන අරාබි බසින් හඳුන්වන්නේ 'මස්ජිඩ ' යන නමිනි. මෙම දේවස්ථාන දෙවියන් යැදීම සඳහා පමණක් නොව එකිනෙකා හමු වීම් සහ අධ්‍යාපන කටයුතු සඳහා ද ඉස්ලාම් භක්තියකයන් විසින් භාවිතා කරනු ලබයි.

| ලබා දුන් පිළිතුර | සිසුන් සංඛ්‍යාව | ප්‍රතිශතය |
|---|---|---|
| ඔවුන්ගේ ආගමික කටයුතු සිදු කිරීමට නියමිත පූජනීය ස්ථානයකි. | 55 | 77.5% |
| එය ලෝක වැසියන්ට ම සාමය හා ශාන්තිය පතුරවන ආගමික සිද්ධස්ථානයකි. එය ලෝක වැසියන්ට ම සාමය හා ශාන්තිය පතුරවන ආගමික සිද්ධස්ථානයකි. | 4 | 5.6% |
| එහි සිදුකරන කටයුතු පිළිබඳ අභිරහසකි. | 19 | 26.8% |
| අවශ්‍යතාවයට වඩා වැඩි දේවස්ථාන ගණනක් රටේ ව්‍යාප්තව තිබීම. | 16 | 22.5% |
| ප්‍රචණ්ඩකාරී ක්‍රියා පුහුණු කරන මධ්‍යස්ථානයක් වීම.9.9 | 7 | 9.9% |

(Source: Research 2021)

මෙය පිළිබඳව අප විමසූ කල ඔවුන්ගේ බහුතරය මතය වූයේ මුස්ලිම්වරුන්ගේ ආගමික කටයුතු සිදු කිරීමට නියමිත වූ පූජනීය ස්ථානයක් ලෙසය එමගින් මුස්ලිම් වරුන් පිළිබඳව මෙවැනි අවබෝධයක් ලබා තිබීමෙන් ඔවුන් තුළ තුල මුස්ලිම් දේවස්ථාන පිළිබඳව යම් සත්‍ය හැඟීමක් පැවතී ඇත. තවද සමහරුන් විසින් මෙහි සිදුකරන කටයුතු පිළිබඳ අභිරහස් වන බවක් ද තවද මේ ප්‍රචණ්ඩකාරී ක්‍රියා වලට පුහුණු කරන පුහුණු මධ්‍යස්ථානයක් බව ද අවධාරණය කර තිබුණි. මුස්ලිම් දේවස්ථාන පිළිබඳව වැඩිදුර අවබෝධයක් දැමීමේදී මෙවැනි අදහස් දැරීමේදි කිසියම් අවබෝධයක් ලබාගෙන අදහස් ප්‍රකාශ කිරීමට වගබලා ගත යුතු වන අතර තවදුරටත් අවශ්‍යතාවයට වඩා වැඩි දේවස්ථාන ගණනක් රටේ ව්‍යාප්තව තිබීමසැලකිල්ලට ගත යුතු කරුණක් වන අතර එය සුළු සංඛ්‍යාවකගේ මතය වී තිබුණි. නමුදු මෙය ලෝක වැසියන්ට සාමය හා ශාන්තිය පතුර වන ආගමික සිද්ධස්ථානයක් ලෙස අදහස් දැක්වීමට 5.6 % ක ගේ ඉතා සුළු ප්‍රතිශතයකින් දක්වා තිබීම මහත් කණගාටුවට පත්වන කරුණකි. තවද , දේවස්ථානයක් යනු පාර්ශුද්ධ ස්ථානයකි. එහි ඇතුළු වන්නන් ගතින් සිතින් පමණක් නොව වතින් ද පිරිසිදුව සිටිය යුතුය. පිටස්තර සමාජයේ හැසිරෙන නොයෙකුත් සංසාර ප්‍රශ්න මත කැළඹුණු මනස තැන්පත් භාවයට පත් වන්නේ මස්ජිද් තුළය. එහි ඇති නිසල නිහඬ ගාම්භීරත්වය මිනිසා මනස තුළ ඉතා සැනසිලිදායක හැඟිම් උපදී. තම සිත නැමැති රාජ්‍ය සාතාන් නමැති ද්‍රෝහියා ගෙන් ආරක්ෂා වීමට සුදුසුම ස්ථානය මස්ජිද් නැවති බංකර යයි හඳුන්වනු ලබයි. ඒ අනුව මුස්ලිම් වරුන් බංකර ඉදිකර තියන මේ චෝදනාව වැරදි විදිහට වටහා ගෙන කීවත් ඒ තුළ යම් සත්‍ය බවක් ගැබ් වී ඇති බව පිළිගත යුතු කාරණාවක් වේ.


ISBN 978-624-5736-14-0

**5.6 මුස්ලිම්වරුන්ගේ අනිවාර්ය නැමඳුමක් වන පස් වේල් සලාතය සඳහා සිදුකරනු ලබන කැඳවීම (අසාන්)**

අදාන් යන අරාබි වචනය ශක්තිය, නැමඳුම සඳහා කැඳවුම යන සිංහල අරුත ගෙන දෙයි. මුස්ලිම්වරුන් සර්ව බලධාරී අල්ලාහ් උදෙසා සිදු කරන දෛනික පස් වේල් නැමදුම (සලාතය) මස්ජිදයක් තුල සාමූහික වශයෙන් රැස් වී ඉටු කිරීම සඳහා නායක මුහම්මද් නබි තුමාණන් විසින් මෙම ජනතා කැඳවුම අනුමත කොට ආරම්භ කරන ලදී.

මෙලෙස අදානයේ තවත් එක් අරමුණක් පිළිබඳව විස්තර කරන ජාත්‍යන්තර අධිකරණයේ විනිසුරු සී. ජී. වීරමන්ත්‍රී විසින් 'ඉස්ලාමීය නීති සංග්‍රහය' නම් වූ ඔහුගේ කෘතියක සඳහන් කරනුයේ ඉස්ලාම් දහමේ ව්‍යාප්තිය සඳහා මෙම අදාන් නම් කැඳවුමේ රැව් පිළිරැව් දීම හේතුවක් වූ බවයි. ඉස්ලාමීය පාලනයේ දිග් විජය හා ව්‍යාප්තිය කඩුවෙන් නොව නිසි අවබෝධයෙන් සත්‍යය පිලිගත් ජනතාවගේ ඉස්ලාමය වැලඳගැනීම් මගින්ම සිදු වූවා යන්නටද එය කදිම නිදසුනකි.

| ලබා දුන් පිළිතුර | සිසුන් සංඛ්‍යාව | ප්‍රතිශතය |
|---|---|---|
| අසහනකාරී තත්ත්වයක් ඇති කරයි. | 11 | 15.5% |
| ශබ්ද දූෂණය වීමට එක් කාරණයකි. | 7 | 9.9% |
| එය ඔවුන්ගේ ආගමික අයිතියකි. | 46 | 64.8% |
| වැඩි පල්ලි සංඛ්‍යාවකගේ ශබ්දය එකවර ඇසීමේදී අසහනකාරී තත්වයක් මතු වීම. | 29 | 40.8% |
| වෙනත් භාෂාවක් බැවින් ශ්‍රවණය කිරීමේදී යම් බයක් ඇති වීම. | 6 | 8.5% |

(Source: Research 2021)

ඒ අනුව විටෙක සලාතය සඳහා නියමිත වේලාව දැනුවත් කිරීමටත් තවත් විටෙක අති උතුම් ඉස්ලාමීය මාර්ගය වෙතට ගෞරවණීය අයුරින් ජනතාව කැඳවීම යන අරමුණු පෙරදැරි කරගත් මුස්ලිම් වරයෙකුට මෙතරම් වැදගත් වූ මෙම අදාන් කැඳවුම ඉතාමත්ම ගෞරවයෙන් යුතුව ඉටු කිරීම සෑම මුස්ලිම්වරයෙකුගේම වගකීමයි.

එබැවින්, මෙය මුස්ලිම්වරුන්ගේ ආගමික අයිතියක් ලෙස බහුතරයගේ ප්‍රකාශය වුණ අතර වැඩි පල්ලිය සංඛ්‍යාවකගේ අසාන් එකවර ඇසීමේ දී සිදුවන සිදුවන අසහනකාරී තත්ත්වය හා ශබ්ද දූෂණය පරිසරයට එක් වීම පිළිබඳ වත් පිළිබඳවත් මොවුන්ගේ විවිධ මතිමතාන්තර අදහස් එක්කොට තිබුණි.තවද අසානය වෙනත් භාෂාවක් බැවින් මෙරට තුළ ශ්‍රවණය කිරීමේදී යම් බයක්ද ඇතිවන බව ඔවුන් සඳහන් කර තිබුණි .අතීතයේ වූ මුතුන්මිත්තන් ඒ කාර්යය නිසියාකාරව ඉටු කිරීම නිසා අදාන් කැඳවුම කෙරෙහි අන්‍ය සමාජයන්ගෙන් කිසිදු බාධාවක් නොවීය. නමුත් වර්තමානයේ ඇතැමුන්ගේ අත්තනෝමතික ක්‍රියා හේතුවෙන් සුලුතර අවස්ථාවන් වලදී මෙම අදාන් කැඳවුම කෙරෙහි අන්‍ය සමාජයන්ගෙන් විරෝධතා ගොනු වූ අවස්ථා පවති. ඒවා ගැන විපරම් කර බැලීමේදී මතු වූ කාරණා


ISBN 978-624-5736-14-0

අතර සැලකිය යුතු කරුණක් වූයේ "පීඩාකාරී අධික ශබ්දය පරිසරයට මුදා හැරීමෙන් සිදුවන අපහසුතා" ඇතිවීම් වේ. ඒ අනුව නූතන මුස්ලිම් සමාජය මෙම අදාන් කැඳවීමේ කාර්යයන් ඉටු කිරීමේදී වගකීම් පැහැර හැරීමක් සිදු නොවන අයුරින් කටයුතු කිරීමට තමන්ට විශාල වගකීමක් තිබෙන බව තරයේ වටහා ගත යුතුය. එබැවින් අදාන් කැඳවුම කරන සෑම විටම අදානයේ අරමුණ අවබෝධ කර ගනිමින් පිළිගත් නීතිගත ශබ්ද පරිමාණයකට අනුගතව සියල්ලන්ගේ සවනට සැනසුමක් ගෙන දෙන අයුරින් මිහිරි හඬින් එම කැඳවුම කළ යුතුය. එය බහුවිධ සමාජයක මුස්ලිම් හා මුස්ලිම් නොවන සියලු දෙනාගේ යහ පැවැත්ම කෙරෙහි වැදගත් වේ.

ඒ අතරම මුස්ලිම් නොවන සහෝදර සහෝදරියන් ද පිළිගත් ක්‍රමවේදයන්ට අනුව සිදු කරනා අදාන් කැඳවුමට විරුද්ධ නොවිය යුතුයි. මුස්ලිම් නොවන යම් අයෙකුට "මෙතරම් දියුණු තාක්ෂණයක් ඇති වර්තමානයේ මුස්ලිම් වරයෙකුට සලාතය සඳහා වේලාව දැන ගැනීමට අදානය හැර වෙනත් විකල්පයක් නැති දැයි" ප්‍රශ්න කළ හැක. නමුත් අදාන් කැඳවීමේ අරමුණු මොනවාදැයි නිසියාකාරව වටහාගැනීම එම ගැටලුවට පිළිතුරු සෙවීමේදී උපකාරී වේ.

ඒ සියල්ලක්ට වඩා අදානය යනු පුරාණයේ පටන් ඉස්ලාමීය සංස්කෘතිය හා තදින් බැඳුණු සංස්කෘතික හා ආගමිකමය අංගයක් බව අප සැවොම පිළිගත යුතුය. බහුවිධ සමාජයක සියලු ජන කොටස් වල සංස්කෘතික අගයන්, විශ්වාසයන් හා ඇදහිලි වලට ගරු කිරීම මහත්මා ගති පැවතුම් ඇති මිනිසෙකුගේ ලක්ෂණයකි. ඒ නිසාම මුස්ලිම් හා මුස්ලිම් නොවන සියලු දෙනාම අන්‍යන්ගේ අනන්‍යතාවයට හා නිදහසට හානියක් නොවන අයුරින් සෑම විටම කටයුතු කිරීම සමාජයේ අනාගත සුබ සිද්ධිය උදෙසා ඉමහත් දායකත්වයක් සපයයි

### 5.7 වසර 1400 කට පෙර පහළ වූ මුස්ලිම්වරුන්ගේ ශුද්ධ ග්‍රන්ථය වූ අල් කුරානය

අල් කුරානය ලොව පහල වූයේ මීට වසර 1400 පෙරයි. එදා මෙදා තුර මෙම ග්‍රන්ථය තරම් කියවූ වෙන කිසිඳු ග්‍රන්ථයක් අහලකවත් නොමැති බව අවිවාදයෙන් යුතුව පිළිගත යුතුවේ. අල්ප මාත්‍රයකුදු වෙනස් කිරීමකට ලක් නොවී, එදා අල්ලාහ් දෙවියන් වහන්සේ විසින් පහල කල ආකාරයටම, නබි සල්ලල්ලාහු අලෙෛහිවසල්ලම් තුමා පැවසූ ආකාරයටම මේ වනතුරු ලොව පුරා කෝටි ප්‍රකෝටි සන්ඛ්‍යාත ජනයා මෙම ග්‍රන්ථය සියැසින් දැක පාරයනය කිරීමට තරම් භාග්‍යයක් උදා කර ගත්තෝ වෙති.

මෙලෙස අද අප භාවිතා කරනු ලබන අල් කුර්ආනය කිසිඳු විකෘති වීමක් නොමැතිව එදා හා සමානවම අද වනතුරුම ආරක්ෂා වී තිබීම හාස්කමකි. අනෙකුත් ආගමික මූලාශ්‍ර ග්‍රන්ථ වක්තෘවරයා හා සමගම විකෘතිව රචකයාගෙන් රචකයාට වෙනස් ආකාරයේ එකිනෙකට පටහැනි කරුණු ඉදිරිපත් වෙද්දී, ඉස්ලාම් දහමේ සියලුම සහාබා සගයින් කිසිඳු පැකිලීමකින් තොරව, කිසිඳු මත ගැටුමකින් තොරව, කිසිඳු භේදයකින් තොරව මෙලෙස අල් කුරානය ග්‍රන්ථය එක ලෙසම ලියා තබා අනාගත සමාජයේ සියලුම දෙනාට කිසිඳු අයුරකින් හෝ අදහස් මත ගැටුමක් නොවන ලෙස ඉදිරිපත් කර තැබීම හාස්කමකි.


ISBN 978-624-5736-14-0

| ලබා දුන් පිළිතුර | සිසුන් සංඛ්‍යාව | ප්‍රතිශතය |
|---|---|---|
| එය ඔවුන්ගේ ප්‍රධානතම ආගමික ග්‍රන්ථයක් වේ. | 46 | 64.8% |
| එය මුස්ලිම්වරුන්ට මුළු ජීවිතයම හැඩගස්වා ගත හැකි පරිදි පහළ වූ මාර්ගෝපදේශයකි. | 14 | 19.7% |
| එහි සැඟවුණු යම් යම් අභිරහස් තොරතුරු ඇත. | 3 | 4.2% |
| එහි මුස්ලිම්වරුන්ට පිළිපැදීමට අපහසු නීති රීති රැසක් අන්තර්ගත වී ඇත. | 5 | 7% |
| මෙහි ප්‍රචණ්ඩකාරී අදහස් ඉස්මතු කරයි. | 7 | 9.9% |
| අල් කුරානය  නබිතුමාගේ අදහසක් පමණි. | 6 | 8.5% |
| එහි අන්තර්ගතය සමකාලීනව උචිත නැත. | 7 | 9.9% |
| මේ පිළිබඳව කිසිඳු අදහසක් නොමැත .22.5 | 16 | 22.5% |

(Source: Research 2021)

එබැවින්, අල් කුරානය පිළිබඳ ඔවුන් ගෙන් විමසූ කල ඔවුන් සඳහන් කර තිබූ ආකාරයට බහුතරයක් විසින් එය අපගේ ප්‍රධාන ධර්ම ආගමික ග්‍රන්ථය ලෙස සඳහන් කර තිබුණි. ධනාත්මක අදහස් ඔස්සේ ගිය කල මෙය මුස්ලිම්වරුන්ට ලබාදී ඇති ජීවිතය හැඩගස්වා ගත හැකි මාර්ගෝපදේශයක් ලෙසද දක්වා තිබුණි. ඒ අතරම මෙහි අන්තර්ගතය සමකාලීනව උචිත නොවන ආකාරයට හා මේ මුළුමනින්ම නබිතුමාගේ අදහසක් පමණ ද ද සමහරුන් වැරදි අවබෝධයක් ලබාගෙන ඇත. තවදුරටත් ප්‍රචණ්ඩකාරි අදහස් ඉස්මතු කරන හා එහි සැඟවුණු යම් යම් අභිරහස් තොරතුරු ද පැතිරවීමේ උත්සාහයක් බව අල් කුරානය අවබෝධයකට ලක්වී ඇත. නමුත් ඒ අතරම ප්‍රතිශතයකින් අල් කුරානය - ඒ පිළිබඳව කිසිඳු අදහසක් නොමැති බව ද ඔවුන් අවධාරණය කොට තිබුණි. මෙවැන්නන් අවබෝධයක් නොමැතිව සඳහන් කරන විට ඔවුන් හැදෑරූ අධ්‍යාපනය තුළ කිසියම් අසම්පූර්ණ භාවයක් තිබෙන පෙනී යනු ඇත.

කුරාණයේ විවරණය ලෙස සලකනු ලබන්නේ නබිතුමාගේ වදන් සහ ක්‍රියාවන්ය. එබැවින් කුරානය හැදෑරීමේදී ඒවා ගැන මනා දැනුමක් තිබීම අත්‍යවශ්‍ය වේ. තවද කුරානය නිවැරදිව තේරුම් ගැනීම සඳහා ආරාබි භාෂාව පිළිබඳ මනා දැනුමක් තිබිය යුතුය.තවද කුරානයක් පිළිබඳ නිවරදිව අර්ථකථනය කිරීමට නම් එහි තිබෙන වැකි පහළ වූ ආසන්නතම හේතුව දැනගෙන සිටීම අත්‍යවශ්‍ය වේ. මෙම අවශ්‍යතා සම්පූර්ණ නොකර කුරානයට අර්ථකථනය කිරීම බලවත් වරදකි.

එසේ තිබියදී අල්-කුර්ආනයට විවේචන එල්ල කරන බොහෝ දෙනෙකුට කුරානය පිළිබඳ නිවැරදි අවබෝධයක් නොමැත.සැබවින්ම ඔවුන් කුරාණයේ විවේචනය කිරීමට පෙර එම ග්‍රන්ථය ගවේෂණය කර තිබීම කෙසේ වෙතත් එය එක් වතාවක් කියවා තේරුම් ගෙන නැගෙන තිබේදැයි සැක හිටය.

එබැවින් කුරානය විවේචනය කරන බොහෝ අයගේ විවේචනයන් ගේ කිසිම පදනමක් නොමැතිව බව අවධාරණයෙන් කිව යුතුය. මුස්ලිම් නොවන බොහෝ දෙනෙක් ඉස්ලාම් දහම හා අල්-කුර්ආනයට විවේචනය කරන්නේ කාගෙවත් කීමට මිස අරාබි වචනයක්වත් දැනගෙන නොවේ.

එබැවින් අල් කුරානය මිනිස් වර්ගයා වෙනුවෙන්ම නිවැරදි දහම් මඟ පෙන්වීම සඳහා පහළ වූ එකක් බව වමනය කළ හැකිය .

**5.8 ඉස්ලාම් ආගමික දේව දේවදූතයන් වූ මුහම්මද් නබි (සල්) තුමා**

මුහම්මද් සල් තුමා (ක්‍රි.ව. 570 - 632) අරාබි නායකයෙකි. ඔහු එවකට පැවති දේශපාලන, ආගමික හා සමාජ ගතිකයේ විශාල වෙනස්කම් සිදු කළේය.

| ලබා දුන් පිළිතුර | සිසුන් සංඛ්‍යාව | ප්‍රතිශතය |
|---|---|---|
| ඔහු ලොවට උතුම් ශ්‍රේෂ්ඨ හා ආදර්ශමත් නායකයෙකි. | 9 | 12.7% |
| ඔහු උසස් ගතිගුණ වලින් හෙබි යහපත් පුද්ගලයෙකි. | 9 | 12.7% |
| ඔහු බලයට ලැදි සහ ප්‍රචණ්ඩකාරි අදහස් පැතිරූ පුද්ගලයෙක් වේ. | 3 | 4.2% |
| මුස්ලිම්වරුන් විසින් මුහම්මද් නබිතුමාව වැඳුම් පිදුම් කරති. | 21 | 29.6% |
| ඔහු පිළිබඳ කිසිදු අදහසක් නොමැත. | 45 | 63.4% |

(Source: Research 2021)

ඉස්ලාමීය ඇදහිල්ලේ අනුගාමිකයන් විසින් ඔහු අවසාන අනාගතවක්තෘවරයා ලෙස සලකනු ලබන අතර, ඔහු "දෙවියන් වහන්සේගේ දූතයා" යැයි සිතයි. ඔහුට මුහුණදීමට තිබූ පරමාර්ථය වූයේ අරාබිවරුන්ගෙන් පටන් ගෙන මනුෂ්‍යාත්වයට නායකත්වය දීමයි.

මුහම්මද් නබි (සල්) තුමා ඉස්ලාම් දහම් පණිවිඩය ප්‍රචාරය කිරීම සඳහා අල්ලාහ් විසින් පත්කරනු ලැබූ අවසාන වක්තෘවරයාය. එතුමාට පෙරත් බොහෝ වක්තෘවරුන් මෙලොවට පැමිණ ඇත. මුහම්මද් නබිතුමාගේ විශේෂත්වය වන්නේ ඔහුගෙන් පසු නබිවරුන්ගේ පැමිණීම අවසානයකට පැමිණීමය. මින් සනිටුහන් වන වැදගත් කරුණක් වන්නේ ලෝකයේ අවසානයට එය පෙර නිමිත්තක් වීමයි. අල් කුරානය පහළ කෙරුනේ මුහම්මද් නබිතුමා හරහාය. එමගින් ඉස්ලාම් දහම් පණිවිඩය පූර්ණත්වයට පැමිණියේය.

නබි (සල්) තුමා පිළිබඳව ඔවුන්ගෙන් ඇසූ කල ඔවුන්ට වැටහී වැටහිය කරුණක් වන්නේ නබි (සල්) තුමා පිළිබඳව වෙන කිසිදු අදහසක් නොමැති බවයි. විද්‍යාර්ථියෙකු ලෙස උසස් අධ්‍යාපනය ලබා ගැනීමට විශ්ව විද්‍යාලයකට පැමිණ ඇති අවස්ථාවකත් මුහම්මද නබි තුමා පිළිබඳව කිසිදු දැනුවත් භාවයකින් තොරව සිටීමෙන් පෙනී යන්නේ ඔවුන් හැදෑරූ අධ්‍යාපනය තුළ කිසියම් අසම්පූර්ණ භාවයක් තිබෙන බවය .නමුත් තවදුරටත් සමහර පිරිස් මුස්ලිම්වරුන් විසින් නබි සල් තුමාව වැඳුම් පිදුම් කරන බව වැරදි වැටහීමකින් පවතින බව සඳහන් කර ලැබුනේය. ඒ අතර ඔහු ප්‍රචණ්ඩකාරී හා බලයට ආශා වූ චරිතයක් බව ද සමහරුන්ගේ මතය වී තිබුණි. එතුමා වැනි ශ්‍රේෂ්ඨ පුද්ගලයෙකු පිළිබඳව අවබෝධයකින් නොසිටීම ද විද්‍යාර්ථියෙකු වශයෙන් නොකල යුතු දෙයකි. නමුදු ඔහු ලොවට උතුම්

ශ්‍රේෂ්ඨ වන්ත හා ආදර්ශමත් නායකයෙක් යන අදහස සුළු ප්‍රතිශතයකින් පෙන්වා තිබීම කණගාටුවට පත්වන කරුණකි. කෙසේද යත් මුහම්මද් නබි (සල්) තුමා ඉතා කෙටි කාලයකදී මිනිස් සිත් තුල විශාල අධ්‍යාත්මික පෙරලියක් සිදු කළේය. එතුමාගේ ශ්‍රේෂ්ඨත්වය මුස්ලිම් විද්වතුන්ගේ ප්‍රකාශන වලට වඩා මුස්ලිම් නොවන විද්වතුන්ගේ ප්‍රකාශන වලින් දැක ගැනීම වඩාත් ප්‍රයෝජනවත් ය. මයිකල් එච් හාට් "100 most influential people in the world" යන කෘතියේ මුලටම මුහම්මද් නබි තුමාගේ නම සඳහන් කොට ඇත. ඒ අනුව ජේසු තුමාගේ සහ අනෙක් විද්‍යාඥයින්ගේ නම්වලට වඩා ඉදිරියෙන් මුහම්මද් නබි තුමාගේ නම සඳහන් වන්නේය. මේ හැරුණු විට මුහම්මද් නබි තුමාට ලැබී ඇත්තේ දේව පණිවිඩයක් බව මුස්ලිම් නොවන බොහෝ විද්‍යාඥයින්ගේ ප්‍රකාශන වලින් සඳහන් වන්නේය. මහාචාර්ය කීත් මුවර් ප්‍රකාශ කරන්නේ මුහම්මද් තුමා අල්ලාහ්ගේ දූතයෙකු විය යුතු බවයි. තවද මහාචාර්ය මොරිස් බුකෙල් ඔහුගේ "The Qur'an, the Bible and Modern Science" යන කෘතියේ සඳහන් කරන්නේ මුහම්මද් තුමා ජීවත්වූ කාලය ගැන සලකා බැලීමේදී කිසිසේත්ම ඔහුට පහළ වූ කුරානයේ ඇති කරුණු ඔහුගේ වදන් විය නොහැකි බවයි.

### 5.9 මුස්ලිම් දේවස්ථාන (පල්ලිය) වල සිකුරාදා දිනයේ දී මෙහෙයවන ලද දේව මෙහෙය

| ලබා දුන් පිළිතුර | සිසුන් සංඛ්‍යාව | ප්‍රතිශතය |
|---|---|---|
| එය මුස්ලිම් පිරිමින්ට අනිවාර්ය වගකීමක් බවයි. | 34 | 47.9% |
| එහි ඔවුන් එක් රැස් වීමෙන් ඔවුන් තුළ ඇති එකමුතුභාවය හා එක්සත් බව පිළිබිඹු වීම. | 25 | 35.2% |
| එම අවස්ථාවේදී තම දෛනික කටයුතු (ව්‍යාපාර, ආර්ථික, රැකියා) වලින් මිදී සිය දෙවියන් වෙනුවෙන් කාලය පරිත්‍යාග කිරීමකි. | 31 | 47.7% |
| රටේ පරිපාලන නීතියට පටහැනි ක්‍රියාවක් වේ. | 1 | 1.4% |
| එවැනි එක් එක්රැස් වීමකින් අනෙක් සමාජයෙ මිනිසුන් හට අසහනකාරී තත්ත්වයක් ඇති වේ. | 5 | 7% |
| අන්‍ය ආගමිකයන්ට ඇතුළත් වීමට තහනම් වූ ස්ථානයකි. | 14 | 19.7% |
| මුස්ලිම් කාන්තාවන්ට ඇතුළත් වීමට තහනම් වූ ස්ථානයකි. | 24 | 33.8% |

(Source: Research 2021)

ජුම්මා යන අරාබි වචනයේ එක්රැස් වීම යන අදහස ගෙන දේ .මුස්ලිම්වරුන් ජීවත් වන ගම්වල සහ නගරවල සෑම සිකුරාදා දිනකම එහි වෙසෙන මුස්ලිම් පිරිමින් මස් විදියට එක්රැස් ඉටුකර ලබන විශේෂ සලාතය ජුම්මා සලාතය නම් වෙයි .මෙම සමූහ සලාතයේ දී සිකුරාදා වෙලාවේ එක්කෙනෙකුත් දේශනය පැවැත්වීමත් ඔහුත් එම දේශනය අසා සිටින අනෙක් අයත රකඅත් දෙක ක සලාතය ඉටු කිරීමත් මෙහි වැදගත් අංගයන් වේ.

නමුදු මෙම ජුම්මා දේශණය අනුන් සමාජය අතර වැරදි අවබෝධයකින් වටහා ගෙන ඇති අතර නමුදු මේ පිළිබඳව විමසූ කළ ඔවුන්ගේ ප්‍රකාශය වූයේ ඔවුන් එක් රැස් වීමෙන් ඔවුන් තුළ ඇති එකමුතුභාවය හා එක්සත් බව පිළිබිඹු වන අතර තම දෛනික කටයුතු වලින් මිදී ඒ වෙනුවෙන් කාලය පරිත්‍යාග කිරීමක් බැවිනි. එහෙයින් ඉස්ලාම් දහම පිලිබඳව ඉස්ලාම් දහමේ පවතින එකමුතු භාවය පිළිබඳව ඔවුන් දන්නා බව මෙයින් පෙනී යනු ඇත. ඒ අතර සුළුතරයක් විසින් එවැනි එක් රැස්වීම කින් අනික් සමාජයේ මිනිසුන්ට අසහනකාරී තත්ත්වයක් ඇතිවීම ද පරිපාලන රටේ නීතියට පටහැනි ක්‍රියාවක් ඇති බවද ඔවුන් ප්‍රකාශ කර තිබුණි. එය යම්කිසි නිවරදි අවබෝධයකින් ඒ දෙස බැලුවහොත් එහි කිසිදු කර්තව්‍යයක් සමාජයට හානිකර නොවන අන්දමින් පවත්වාගෙන යන බව අවධාරණය කර පෙන්වා දිය හැක.

ඒ අතරම අන්‍යාගමිකයන්ට ඇතුළත් වීමට තහනම් වූ ස්ථානයක් ලෙසද මුස්ලිම් කාන්තාවන්ට ද ඇතුළත් වීමට තහනම් වූ ස්ථානයක් ලෙසද ප්‍රකාශ කර තිබීම හෙයින් ඔවුන් තුළ තවදුරටත් සැකසහිත කරුණු මතු වීමට ඉඩ හැරීමක් බව සිතිය හැක.

### 5.10 ශ්‍රී ලංකාවේ මුස්ලිම්වරුන් හලාල් සහතිකය භාවිතාය පිළිබඳව

| ලබා දුන් පිළිතුර | සිසුන් සංඛ්‍යාව | ප්‍රතිශතය |
|---|---|---|
| එය ඔවුන්ගේ ආගමික අයිතිවාසිකමකි. | 19 | 26.8% |
| එය අන්‍යාගමිකයන් අතර හලාල් ද්‍රව්‍ය සහ භාණ්ඩ භාවිතය සඳහා ගත් උපායක් බව | 17 | 23.9% |
| හලාල් භාණ්ඩ ගුණාත්මක බවින් ඉහළ බව | 19 | 26.8% |
| ශ්‍රී ලංකාව ඉස්ලාමීකරණය කිරීමට දරන උත්සාහයක් බවයි. | 26 | 36.6% |

(Source: Research 2021)

හලාල් ආහාර යනු පාරිභෝගිකයා මේසය වෙත පැමිණෙන තෙක් ඉස්ලාමීය ආගමික මූලධර්මයන්ට අනුකූලව කෙත්වතු, හරිතාගාර හෝ ගොවිපල වලින් එකතු කරන නිෂ්පාදන පිළියෙල කිරීමයි. මෙම නිර්වචනය මදක් පැහැදිලි කළ හොත් එයින් අදහස් කරන්නේ සත්ව, එළවළු, රසායනික හෝ ක්ෂුද්‍රජීවී සම්භවයක් ඇති ආහාර ද්‍රව්‍ය ඉස්ලාමීය නීති වන අමුද්‍රව්‍ය, ආකලන, සැකසුම් ක්‍රම, මෙහෙයුම් තත්වයන් සහ ඇසුරුම්කරණයට අනුකූල වන අතර මෙම නිෂ්පාදන හලාල් ආහාර වේ. වඩාත් සරළව කිවහොත් හලාල් ආහාර යනු ආගම, සෞඛ්‍යය හා සනීපාරක්ෂාව අනුව ආහාර අනුභව කිරීමයි.

ශ්‍රී ලංකාව තුළ ඉස්ලාමීය කරණය කිරීමට උත්සාහ දැරීමක් පවතින බව බහුතරයකගේ මතය විය. මුස්ලිම්වරුන් කිසිදාකවත් හලාල් යන නාමය භාවිතා කොට ශ්‍රී ලංකාව එසේ කරවීමට කිසිදු අදහසක් නොමැති අතර ඔවුන් එය භාවිතා කරන්නේ හුදෙක් ආහාර අනුභව කිරීමට පමණි. තවදුරටත් අන්‍ය ආගමිකයන් අතර හලාල් ද්‍රව්‍ය සහ භාණ්ඩ භාවිතය සඳහා ගත් උපායක් බව ද මෙයින් පැහැදිලිවම ප්‍රකාශ කර තිබේ. මෙයද වැරදි විදියට අවබෝධය කරගෙන පවසනවා මිසක් නිශ්චිත පරීක්ෂණයක්

සිදුකොට සිදුකරන ප්‍රකාශයක් නොවේ. තවදුරටත් හලාල් භාණ්ඩ ගුණාත්මක බවින් ඉහළ දැමීමට ගත් උපක්‍රමයක් බවත් ඔවුන් සඳහන් කර තිබුණි. ඒ අතර මේ ඔවුන්ගේ ආගමික අයිතිවාසිකමක් බව ද සමහරුන්ගේ මතය බවට පත්වී තිබුණි.

### 5.11 මුස්ලිම්වරුන්ගේ අනිවාර්ය වගකීමක් වන උපවාසය (නොම්බි ඇල්ලීම)

ඉස්ලාමයේ විශ්වාසයන් හා ක්‍රියාකාරකම් මිනිසාගේ සිත හා කය පිරිසිදු කර මෙලොව හා පරලොව සතුටු සතුටු දායක ජීවිතයකට පුහුණුවක් ලබා දෙන සැලසුම් වන්නේය. මෙය පරමාර්ථය මතයි සව්මය පිහිටා ඇත්තේය. උපවාසය යන පදය අස්සව්ම් ලෙස අරාබි භාෂා ව්‍යවහාරයේ අර්ථ දක්වා ඇති අතර වැළැක්වීම, වළක්වා ගැනීම යන අදහස් එයින් නිරූපණය වේ. අස්සව්ම් යන පදයට ඉස්ලාමීය නීතියට අනුව පැහැදිලි අර්ථය වන්නේ කෑමෙන් බීමෙන් සහ ලිංගික සම්බන්ධතාවලින් එනම් උපවාස කඩවන සියලු කරුණුවලින් වැළකී අල්ලාහ්ගේ තෘප්තිය පතා කටයුතු කිරීමයි. ඉස්ලාමීය දින දර්ශනය අනුව 9වන මාසය වන රාමළාන් මාසයේ උපවාසයේ ආරක්ෂා කිරීම මුස්ලිම් වූ ස්ත්‍රී පුරුෂ සියලු දෙනාටම අනිවාර්ය වූ වගකීමකි. ඉස්ලාමීය ජීවන සැලැස්මේ පංචමහා වගකීම්වලින් හතරවන ස්ථානය උපවාසයට හිමි වේ. උපවාසය ආරක්ෂා කිරීම රාමලාන් මාසයට පමණක් සීමා කර නැත.

| ලබා දුන් පිළිතුර | සිසුන් සංඛ්‍යාව | ප්‍රතිශතය |
|---|---|---|
| එය දුගීන්ගේ කුසගින්න හා පිපාසය වටහා ගැනීමක් ලෙස | 33 | 46.5% |
| එය ඔවුන්ගේ දෙවියන් විසින් පනවන ලද අණට කීකරු වීමක් ලෙස | 14 | 19.7% |
| උතුම් වූ රමලාන් මාසය පිළිගැනීමක් ලෙස | 24 | 33.8% |
| ඔවුන් නොකා නොබී ඔවුන්වම පීඩාවට පත් කර ගැනීමක් ලෙස | 11 | 15.5% |
| සෞඛ්‍යයමත් ජීවිතයක් ගත කිරීමට රුකුලක් වෙයි. | 9 | 12.7% |

(Source: Research 2021)

මේ පිළිබඳව විමසූ කල එය දුගීන්ගේ කුසගින්න හා පිපාසය වටහා ගැනීමක් ලෙස බහුතරයක්ගෙන් අදහස වී ඇත. තවදුරටත් මෙය ඔවුන්ගේ උතුම් වූ රමලාන් මාසයේ පිළිගැනීමක් ලෙස ද තවත් සමහරුන්ගේ අදහස වෙලා තිබේ. ඒ හා සමග සෞඛ්‍යයමත් නීරෝගීමත් ජීවිතයක් ගත කිරීමට ද රුකුලක් වන ආකාරයද සඳහන් කර තිබුණි. නමුදු නොකා නොබී ඔවුන්වම පීඩාවට පත් කර ගැනීමක් යන අදහස ද තිබීම ඔවුන්ගේ වැරදි අවබෝධයට හේතුවක් වේ.

මිනිසාගේ හැඟීම් පාලනය කර ක්‍රමවත් කිරීමේ මූලික ආශාවන් මැඩ පවත්වා මිනිසා ඒවායේ ස්වාමියා බවට පත්කිරීමෙන් මහඟු කාර්යය සව්මය නිසා ඉටු වන්නේය. මෙහි වී පොහොසතුන්ට දුප්පතුන්ගේ තරම දැන ගැනීමටත් ඔවුන් කෙරෙහි ද කරුණාව දැක්වීමටත් සව්මය අවස්ථාව සලසයි. සමාජයේ දක්නට ලැබෙන උස් පහත්කම් දුරු කිරීම පිළිබඳ චිත්ත පරිණත භාවයක් ඇති කරන්නේය.

### 5.12 මුස්ලිම් සමාජය තුළ මාංශ දානය (උල්හියා)

| ලබා දුන් පිළිතුර | සිසුන් සංඛ්‍යාව | ප්‍රතිශතය |
|---|---|---|
| එය දෙවියන්ගේ අණට කීකරුව කරන ප්‍රාණ පරිත්‍යාගයක් වේ. | 9 | 12.7% |
| එය දුගීන්ගේ කුස පිරවීම සඳහා ආහාරයක් ලෙස අනුභව කිරීමට ලබා දේ. | 13 | 18.3% |
| එය සත්ව හිංසනයකි. | 44 | 62% |
| ශ්‍රී ලංකා වැනි බෞද්ධ රටකට එය නොගැලපෙන ක්‍රියාවක් වෙයි. | 28 | 39.4% |
| ආර්ථික සංවර්ධනය කෙරෙහි දායක වේ. | - | - |
| පරිසර සමතුලිතතාවය රැකගත හැකිවීම. | 1 | 1.4% |

(Source: Research 2021)

ඉස්ලාමයේ දන් දීම දිරි ගන්වයි. මිනිසුන් කැමැත්තෙන් අනුභව කරන මාංශ වර්ගයක් දන්දීමේ අවස්ථාවන්ද ඇති කරවයි. මේ පදනමෙන් ගොඩනැගුණකි; උල්හියා වැනි දාන ක්‍රමයන් ....

උල්හියා සඳහා වූ කාලය නම් දුල්හජ් මාසය දහ වන දින ඊද් සලාත ඉටු කරපු පසු උල්හියා ඉටුකිරීම උතුම් වන්නේය.

මුස්ලිම් සමාජය තුළ සතුන් බිලිදීම පිළිබඳව ඔබ දරන්නේ කුමන ආකල්පයක්ද යැයි විමසූ කල මෙය සත්ත්ව හිංසනයක් බව බහුතරයෙන් ගේ ප්‍රකාශය මත හෙළි වුණි. මෙය සත්ත්ව හිංසනයක් ලෙස සලකනවා නම් ශ්‍රී ලංකාවේ ඝාතනය කරන අන් සතුන්ට ද එය එලෙස ක්‍රියාත්මක කිරීම හෝ සිතිය යුතුයි. නමුදු එය එතරම් සිතීම ප්‍රායෝගික නොවේ. කෙසේද යත් ශ්‍රී ලංකාවේ නොව මුළු ලොව තුළ පවතින සියලු සතුන් ජීවීන කොට්ඨාසයක් වෙති. ශ්‍රී ලංකා වැනි බෞද්ධ රටකට කිසිසේත් නොගැලපෙන තත්ත්වයකින් පවතින බව තවදුරටත් ප්‍රකාශය විය. තවද එය දෙවියන්ගේ අණට කීකරු ව කරන පරිත්‍යාගයක් බවත් ඒවා කුස පිරවීම සඳහා මස් පිණිස අනුභව කිරීමටත් හැකි බව සුළුතරයකගේ මතය විය. මෙ වැනි අරමුණක් සඳහා පමණක් මෙය ඉටු කරන බව අවබෝධය කරගත යුතු අතර මෙයින් කිසිවෙකුටත් හානියක් නොවන ආකාරයෙන් කටයුතු කිරීමද මුස්ලිම්වරුන්ගේ එකම වගකීම විය යුතුය.

තව ද, උල්හියාවේ කිසිම කොටසක් විකිණීම හෝ වැඩ කරන්නන්ට කුළි වශයෙන් දීම හෝ නොකළ යුත්තක්තකි. අං, සම්, ආදිය ද පිනටම දියයුතු වන්නේය්. එසේ නොමැති නම් තම ප්‍රයෝජනය සඳහා තබා ගත හැකිය.මස් ඉන් කොටසක් හෝ නොපිස දූප්පතුන්ට දන්දීම යුතුකම වන්නේය. එහෙත් පීකුදු වලින් කොටසක් තම ප්‍රයෝජනය සඳහා තබාගෙන ඉතිරි සියල්ල දන් දීමයි විශිෂ්ට වන්නේය.

### 5. නිගමනය

ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලයහි ඉගෙනුම ලබන අන්‍යාගමික ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගෙන් මුස්ලිම්වරුන්ගේ සංස්කෘතික අංගයන් කෙරෙහි ඔවුන්ගේ ආකල්පය විමසා බැලීම සඳහා දියත් කරන ලැබූ

සමීක්ෂණයෙන් පෙනී යන්නේ ශ්‍රී ලංකාව තුළ විවිධ ජාතීන් ජීවත් වුවද එය අන් අයට හිරිහැරයක් නොවන පරිදි පිළිපැදිය යුතු බව ද තවත් ජාති ආගම් කුල භේදයෙන් ඔබ්බට ගොස් ශ්‍රී ලංකා වැසියන් යන නාමයෙන් එකා මෙන් ජීවත් විය යුතු බව ඔවුන් අවධාරණය කරති.එමෙන්ම මුස්ලිම්වරුන්ගේ සමහර සංස්කෘතික අංගයන් කෙරෙහි ඔවුන් හට එතරම් පැහැදීමක් නොමැති නිසා ඔවුන් එය වැරදි ආකාරයෙන් වටහා ගෙන ඇති බවක් පෙනී යයි. එයට හේතුව අප විසින් සිදු වන සුළු සුළු වැරදි එයට මුල් වී ඇති බව වටහා ගත හැකිය. කෙසේ නමුත් රටේ ලෙස තමාට අන්‍යන්‍ය ආගම් සංස්කෘතීන් පිළිපැදීමට අවශ්‍ය වුවත් ආගමික සංහිඳියාව ඇති කිරීම රටේ අනාගතයට උපකාරයක් බව තේරුම් ගත යුතුය.

## 6. යෝජනා

- ශ්‍රී ලංකා අග්නිදිග විශ්ව විද්‍යාල තුළ අන්‍යාගමිකය ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට මුස්ලිම් සංස්කෘතිය දැනගැනීමට පිළියම් යෙදීම.
- බහු සංස්කෘතික ජන සමාජයක් වන ශ්‍රී ලංකාව තුළ අන්‍යාගමිකයන්ගේ සංස්කෘතිය දැන සිටීම කාගෙත් යුතුකමකි.
- සමකාලීන අන්‍ය සංස්කෘතීන් පිළිබඳව දැනගැනීමට අන්තර්ජාලය හා සමාජ මාධ්‍යයන් තිබෙන නිසා ඒවා මාර්ගයෙන් අධ්‍යයනය කිරීම.
- ශ්‍රී ලංකා අග්නිදිග විශ්ව විද්‍යාලයේ පරිපාලන අංශය විසින් සියලු ආගම් අදහන සිසුන් එක්රැස් කර වැඩපිළිවෙළවල් දියත් දීම.
- අන්‍ය ආගමික සිසුන් දැනුවත් කිරීම සඳහා වැඩ මුළු පැවැත්වීම.
- සියලු සිසුන් එක්රැස්වී සාමූහිකව බාහිර ක්‍රියාකාරකම් වල නියැලීම. ( ක්‍රීඩා උත්සව , අධ්‍යාපනික චාරිකා,වෙනත් සංස්කෘතික උත්සවයන්)
- භාෂාවන් අතර එකාබද්ධ ගොඩනැගීමක් සිදු කළ යුතුය.
- සංස්කෘතික විවිධත්වය ශක්තිමත් වීමට උපාය මාර්ගික වැඩ කටයුතු දියත් කළ යුතුය.
- සමාජය තුළ සංවාද ,කතිකාවන් ඇති කළ යුතු ය.
- පාසල් විෂය මාලාව තුළ සංස්කෘතික විවිධත්වය පිළිබඳව සඳහන් කළ යුතු ය.
- සියලු සිසුන් එක්රැස්වී සාමූහිකව බාහිර ක්‍රියාකාරකම් වල නියැලීම. (ක්‍රීඩා උත්සව, අධ්‍යාපනික චාරිකා, වෙනත් සංස්කෘතික උත්සවයන්)

## 7. විමර්ශිත ග්‍රන්ථාවලිය

අජ්වාඩ්, එෆ්. (2019). *මුහම්මද් නබිතුමා කවුද?.* https://yayuthumaga.com/new/?p=6413

අෆ්ලල්, එම්. එම්. (2015). *බෞද්ධ, ඉස්ලාම් සුහදත්වය සහ මුස්ලිම් සමාජය,* දෙහිවල.

සිල්වා, කේ.ඩී., අෆ්රා. එන්., වික්‍රමසංහ ඩබ්ලිව්. එම්.කේ.බී. (2017). *ලංකාවේ අන්තර් ආගමික සහයෝගිතා සහ ආරවුල්*, කොළඹ:ජනවාර්ගික අධ්‍යනය සඳහා වන ජාත්‍යන්තර කේන්ද්‍රය.

මිනාස්, එෆ්. (2020). ''අදාන්''නම් කැදවුම හා වර්තමානය. https://wiyathungeadaviya.blogspot.com/2020/07/blog-post.html?m=1

ජයවික්‍රම, ඩී. (2018). *ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක හතරක් තුළ අන්තර් ආගමික ගැටුම්*, කොළඹ: ජනවාර්ගික අධ්‍යනය සඳහා වන ජාත්‍යන්තර කේන්ද්‍රය.

ෆස්ලාන්, එම්., වන්නියසිංහම්, එන්. (2015). *බිදී යන ප්‍රජාව*, කොළඹ: ජනවාර්ගික අධ්‍යනය සඳහා වන ජාත්‍යන්තර කේන්ද්‍රය.


ISBN 978-624-5736-14-0